## නවීන තාක්ෂණ පිළිබඳ ආතර් සී. ක්ලාක් ආයතනය

### 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 1.2 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර,මූල්‍ය ප්‍රකාශනවලින් 2011 දෙසැම්බර් 31 දිනට නවීන තාක්ෂණ පිළිබඳ ආතර් සී ක්ලාක් ආයතනයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.2.1 උසස් ගිණුම්කරණ පරිචයන්

ආයතනය විසින් අනුගමනය කරනු ලබන සියළුම ගිණුම්කරණ ප්‍රතිපත්ති මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි. උදාහරණ - පර්යේෂණ වියදම්, බාහිර ව්‍යාපෘති වියදම් හා ප්‍රදර්ශන සහ සම්මන්ත්‍රන වියදම් ගිණුම්ගත කිරීම.

### 1.2.2 ගිණුම්කරණ අඩුපාඩු

පහත දැක්වෙන ගිණුම්කරණ අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) හර හා බැර ශේෂ එකිනෙකට කපාහැර ගිණුම්වලින් දැක්විය නොහැකි වුවද රු.5,910 ක් වූ ණයහිමි හර ශේෂය රු.6,455 ක බැර ශේෂයෙන් අඩුකර දක්වා තිබුණි.

(ආ) වර්ෂ 03 ඉක්මවන ලද රු.195,025 ක ණයගැති ශේෂ සම්බන්ධයෙන් අඩමාන ණය සඳහා ප්‍රමාණවත් වෙන් කිරීම් සිදු කර නොතිබුණි.

### 1.2.3 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්

(අ) ලැබිය යුතු ගිණුම්

(i) ණයගැතියන්ගෙන් වසර 05 ක් ඉක්මවන ලද ණයගැති වටිනාකම රු.73,171 ක් වූ අතර ඒ සම්බන්ධයෙන් ආයතනය විධිමත් ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ii) රු. 11,112,136 ක් වූ ණයගැතියන් සම්බන්ධයෙන් සනාථ කිරීම් ලබා නොතිබුණි.

(ආ) ගෙවිය යුතු ගිණුම්

(i) වසර 05 ට වැඩි රු.645,917 ක් වූ ණයහිමි ශේෂ නිරවුල් කර නොතිබුණි.

(ii) රු. 415,500 ණය හිමියන් සම්බන්ධයෙන් සනාථ කිරීම් ලබා නොතිබුණි.

### 1.2.4 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

පහත දැක්වෙන අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| **නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව** | **අනුකූල නොවීම** |
|---|---|
| (අ) <u>පනත්</u> | |
| (i) 1958 අංක 15 දරන සේවක අර්ථසාධක අරමුදල් පනත<br><br>(ii) 1980 අංක 46 දරන සේවක භාරකාර අරමුදල් පනත | සේවක අර්ථසාධක හා සේවක භාරකාර අරමුදල් සේවකයාගේ මුළු ඉපැයීම් පදනම්කරගෙන ගණනය කළ යුතු වුවද ඊට පටහැනි ලෙස ගණනය කිරීම හේතුවෙන් 2011 ජනවාරි සිට දෙසැම්බර් දක්වා පිළිවෙලින් රු.1,119,763 ක් සහ රු.134,372 ක සේවක අර්ථසාධක හා භාරකාර අරමුදල් අඩුවෙන් ගණනයකර ගෙවීම් කර තිබුණ. |
| (ආ) <u>ශ්‍රී ලංකාණ්ඩුවේ මුදල් රෙගුලාසි</u> | |
| (i) මු.රෙ.110 | හානි හා පාඩු ලේඛනයක් පවත්වා නොතිබුණි. |
| (ii) මු.රෙ. 371(2)(ආ) | තත්කාර්ය අතුරු අග්‍රිම ලබාදිය හැක්කේ රු.20,000 දක්වා පමණක් වුවද ඊට වඩා රු.40,000,50,000 වශයෙන් අත්තිකාරම් මුදල් ලබාදී තිබුණි. පියවීම් කිරීමේදී වැඩකරන දින 20 කට වඩා වැඩි කාලයක් ප්‍රමාද වී පියවූ අවස්ථා 12 ක් නිරීක්ෂණය විය. |
| (iii)මු.රෙ. 751 | වසර ගණනාවක සිට ඉන්වෙන්ට්‍රි භාණ්ඩ සම්බන්ධයෙන් ඉන්වෙන්ට්‍රි ලේඛන පවත්වාගෙන නොතිබුණි. |
| (ඇ) <u>චක්‍රලේඛ</u> | |
| (i) 2006.02.10 දිනැති CSA/1/1/2006 ජනාධිපති චක්‍රලේඛය | ආයතනයේ මාණ්ඩලික නිලධාරීන් දෙදෙනෙකු ගරු අග්‍රාමාත්‍යතුමාගේ අනුමැතිය ලබා ගැනීමකින් තොරව විදේශගත වී තිබුණි. |
| (ii) 1992.08.19 දිනැති 26/92 රාජ්‍ය පර්පාලන චක්‍රලේඛ හා 1994.08.03 දිනැති 26/92(1) රාජ්‍ය පර්පාලන චක්‍රලේඛ | ආයතනයේ අංක 301-3949 හා අංක NA-2228 දරන වාහන දෙකට අදාලව රාජ්‍ය ලාංඡනය යොදා නොතිබුණි. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, සමාලෝචිත වර්ෂයේදී ආයතනයේ වැඩ කටයුතුවල මූල්‍ය ප්‍රතිඵලය, පුනරාවර්තන වියදම් සඳහා රජයේ දායකය රු.මිලියන 53.2 ගණන් ගැනීමට පසු රු. මිලියන 3.6 ක අතිරික්තයක් වූ අතර, ඊට අනුරූපව ඉකුත් වර්ෂයේ රජයේ දායකය රු.මිලියන 52.9 ගණන් ගැනීමට පසු අතිරික්තය රු.මිලියන 5.9 ක් විය. අභ්‍යන්තර ආදායම් රු.මිලියන 5.0 කින් වැඩිවීම සහ පුනරාවර්තන වියදම් රු.මිලියන 7.3 කින් වැඩිවීම මේ සඳහා මූලිකව බලපා තිබුණි.

## 2.2 කාරක ප්‍රාග්ධන කළමනාකරණය

සමාලෝචිත වර්ෂය අවසානයේ ආයතනයේ කාරක ප්‍රාග්ධනය රු.මිලියන 71.4 ක් වූ අතර ඉකුත් වර්ෂය අවසානයේදී ඊට අනුරූපී කාරක ප්‍රාග්ධනය රු.මිලියන 61.9 ක් වූයෙන් කාරක ප්‍රාග්ධනයේ රු.මිලියන 9.5 ක වර්ධනයක් පෙන්නුම් කෙරිණි.

## 3 මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කාර්ය සාධනය

(අ) රොබෝ විද්‍යාගාරය සංවර්ධනය කිරීම සඳහා උපාංග මිලදී ගැනීමට රු.මිලියන 1.5 ක් 2010 වර්ෂයේදී වෙන්කර තිබුණු නමුදු 2011 වර්ෂයේදී හෝ එම මිලදී ගැනීම් සිදු නොකිරීම හේතුවෙන් රොබෝ විද්‍යාගාරයෙන් අපේක්ෂිත අරමුණු ඉටුකරගැනීමට නොහැකි විය.

(ආ) සමාලෝචිත වර්ෂයට පූර්ව වර්ෂ වලදී ආරම්භ කරන ලද ව්‍යාපෘති දෙකක් සමාලෝචිත වර්ෂය තුල කිසිදු කාර්යයක් සිදු නොකිරීම හේතුවෙන් වසා දමා තිබුණි. ඒ වෙනුවෙන් රු.32,894 ක වියදමක් දරා තිබුණි.

(ඇ) නස්ඩා ව්‍යාපෘතියේ (Nasda project) අරමුදලින් එහි අරමුණු ඉටුකර ගැනීමට වර්ෂය තුල කිසිදු ගණුදෙනුවක් සිදුවී නොතිබුණි. එම අරමුදලින් රු.428,958ක් භාණ්ඩාගාර බිල්පත්වල ආයෝජනය කර තිබුණි.

(ඈ) අධ්‍යක්ෂ අරමුදල් සහ ෆයින්ඩ්ස් යන අරමුදල්වලද ඉතා අඩු ක්‍රියාකාරීත්වයක් පැවතුණ අතර ඒවායේ අරමුදල් පිළිවෙලින් රු.749,597 ක් සහ රු.3,753,394 ක් භාණ්ඩාගාර බිල්පත්වල ආයෝජනය කර තිබුණි.

### 3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

(අ) ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව වෙත ලබා දී ඇති සංඥා කුළුණ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කෙරේ.

(i) පැවති ගිවිසුම් කාලය අවසන් වීමත් සමඟ 2010 පෙබරවාරි 01 දින සිට 2011 දෙසැම්බර් 30 දින වන විටත් නව ගිවිසුමකට එළඹ නොතිබුණි.

(ii) 2010 පෙබරවාරි 01 දින සිට 2011 දෙසැම්බර් දක්වා මාසිකව රු.60,000 බැගින් ලැබිය යුතු රු.1,380,000 ක ආදායමක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණු අතර එය මූල්‍ය වාර්තාවලද දක්වා නොතිබුණි.

(iii) යථෝක්ත කුළුණ සඳහා නඩත්තු කටයුතු නිසිලෙස ඉටු නොකිරීම නිසා එය බොහෝ සෙයින් දිරාපත්ව තිබී ඇති අතර අළුත්වැඩියා සඳහා වර්ෂය තුළදී රු.644,051 ක මුදලක් වැය දැරීමට සිදුව තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේදී අනෙකුත් ආයතන වෙත රු.1,827,309 ක ඉන්වොයිසි නිකුත් කර තිබුණද එම මුදල් ද අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) 2010 වර්ෂයට භාණ්ඩාගාර ප්‍රාග්ධන ප්‍රතිපාදන යටතේ වෙන්කර තිබුණු රු.මිලියන 22 ක මුදලින් රු.මිලියන 10 ක මිලදී ගැනීම් 2011 අවසන් කාර්තුව දක්වා සිදු කර තිබණි. රු.මිලියන 2.5 ක ප්‍රතිපාදන වැයකර නොතිබුණි.

### 3.3. නිෂ්ක්‍රිය සහ ඌන උපයෝජිත වත්කම්

(අ) පහත සඳහන් නිෂ්ක්‍රිය වත්කම් නිරීක්ෂණය විය.

| | වත්කම | වටිනාකම රු. | නිරීක්ෂණය |
|---|---|---|---|
| i. | Consumable R.&D.Stock අයිතම් 44 ක් ද R.&D.Computer Consumable තොග අයිතම් 52 | - | 2005 වර්ෂයේ සිට භාවිතා කර නොතිබුණි. |

(ආ) 2005 පෙබරවාරි 28 දින විද්‍යා හා තාක්ෂණ අමාත්‍යාංශයෙන් තාවකාලික පදනම මත ලද 60-5413 දරන බස් රථය ගමන්වාර 02 කට පමණක් විවිධ වැඩසටහන් සඳහා යොදාගෙන තිබුණු අතර ඌන උපයෝජිත තත්වයක පැවතුණි.මෙම බස්රථය දැනට ගර්හිත තත්වයෙන් අපහරණය කිරීමට නියමිත බව අධ්‍යක්ෂවරයා දැනුම් දී ඇත.

## 3.4 හඳුනාගත් පාඩු

Voltage recorder-VR Leco ව්‍යාපෘතිය 2009 වර්ෂයේදී අවසන් වී තිබුණු නමුදු ඒ සඳහා දරන ලද රු.376,475 ක් සමාලෝචිත වර්ෂයේ වියදමක් ලෙස ගිණුම්ගතකර තිබුණි. මෙම මුදල අදාල ආයතනයෙන් ප්‍රතිපූර්ණය කරගත නොහැකි වී ඇති බැවින් විගණනයේදී හඳුනාගත් පාඩුවක් වශයෙන් නිරීක්ෂණය කෙරේ.

## 3.5 කාර්ය මණ්ඩල පරිපාලනය

සමාලෝචිත වර්ෂයේ ආයතනයේ අනුමත සහ තථ්‍ය කාර්ය මණ්ඩල පිළිබඳ විස්තර පහත පරිදි වේ.

| | අනුමත කාර්ය මණ්ඩලය | තත්‍ය කාර්ය මණ්ඩලය | පුරප්පාඩු ප්‍රමාණය |
|---|---|---|---|
| විධායක | 70 | 31 | 39 |
| විධායක නොවන | 70 | 41 | 29 |
| | 140 | 72 | 68 |

මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කෙරේ.

(අ) තනතුරු 68 ක එනම් 49% ක පුරප්පාඩු තිබීම නිසා විවිධ ව්‍යාපෘති වල කාර්යසාධනය ඉතා අවම මට්ටමක පැවතීමට මෙම තත්ත්වය බලපා තිබුණි.

මේ සම්බන්ධයෙන් අධ්‍යක්ෂවරයාගේ අදහස් වන්නේ "තාක්ෂණික කාර්ය මණ්ඩලය සඳහා දැනට ආයතනය විසින් ගෙවන වැටුප හා සමාන සුදුසුකම් සඳහා වෙනත් ආයතනවල ගෙවන වැටුප් හා දීමනා අතර පවත්නා අතිවිශාල වෙනස හේතුවෙන් අනුමත සේවක සංඛ්‍යාව බඳවා ගැනීම සහ රඳවා තබාගැනීම අතිශයින් දුෂ්කර කාර්යයක් වී ඇති බවයි."

(ආ) 2006 ජනවාරි 01 සිට ක්‍රියාත්මක වන පරිදි අංක 6/2006 රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය අනුව රාජ්‍ය සංස්ථා ව්‍යවස්ථාපිත මණ්ඩල වැටුප් සංශෝධනය සඳහා කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 30 ට අනුව බඳවාගැනීමේ හා උසස් කිරීමේ පටිපාටිය සකස් කර ඊට කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබාගත යුතු වුවත්, ආයතනයේ තනතුරු සම්බන්ධයෙන් සමාලෝචිත වර්ෂයේ අවසානය තෙක් බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පටිපාටිය අනුමත කරගෙන නොතිබුණි.

(ඇ) 2010.08.23 දිනැති DMS/E2/24/4/171/2 දරන කළමනාකරණ සේවා දෙපාර්තමේන්තු චක්‍රලේඛය අනුව 2011 වර්ෂයට තනතුරු 18 ක් බඳවා ගැනීමට අනුමැතිය ලබා දී තිබුණද බඳවා ගැනීමේ කාර්ය පරිපාටිය සඳහා අනුමැතිය ලැබීම ප්‍රමාද වීම හේතුවෙන් තනතුරු සඳහා බඳවා ගැනීම් සිදු කර නොතිබුණි.

# 4 ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

## 4.1 සංයුක්ත සැලැස්ම

2007 - 2011 දක්වා කාලය ආවරණය වන පරිදි සකස් කර තිබුණු සංයුක්ත සැලැස්මේ පහත කරුණු නිරීක්ෂණය විය.

(i) සංයුක්ත සැලැස්ම තුල අන්තර්ගත කර තිබුණු ක්‍රියාකාර් සැලසුම්වල ඉලක්කගත ක්‍රියාකාරකම්වල වාර්ෂිකව දැරීමට අපේක්ෂිත පිරිවැය සංඛ්‍යාත්මකව දක්වා නොතිබුණි.

(ii) 2003.06.02 දිනැති රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ අංක පීඊඩී/12 චක්‍රලේඛයේ 5.1.3 ඡේදය ප්‍රකාරව සංයුක්ත සැලැස්ම යාවත්කාලීන කර පවත්වා ගෙන යාමට කටයුතු කර නොතිබුණි.

## 4.2 ක්‍රියාකාර් සැලැස්ම

(i) ක්‍රියාත්මක කිරීමට බලාපොරොත්තුවන ව්‍යාපෘතීන් බොහොමයක මූල්‍ය වටිනාකම් වෙන් වෙන් වශයෙන් ඇස්තමේන්තුකර දක්වා නොතිබුණු බැවින් අත්කරගත් ප්‍රගතිය සමාලෝචනය කිරීමට නොහැකි විය.

(ii) කොටසක් සම්පූර්ණ කර තිබූ ක්‍රියාකාරකම්වල ඒවායේ සම්පූර්ණත්වය ප්‍රමාණාත්මක වශයෙන් දක්වා නොතිබුණි.

(iii) ආයතනයේ විවිධ අංශ 06 ක් යටතේ වාර්ෂික ක්‍රියාකාර් සැලැස්ම අනුව ක්‍රියාකාරකම් 68 ක් ඉලක්ක කර තිබුණද ඒවායින් ක්‍රියාකාරකම් 26 ක් ඉටුකර නොතිබුණි

## 4.3 ප්‍රසම්පාදන සැලැස්ම

රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයෙ 4.2.1, 4.2.2, 4.2.3 වගන්ති ප්‍රකාරව ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්මක්, ප්‍රසම්පාදන කාලසටහනක් හා ප්‍රසම්පාදන කාලසටහන සඳහා සලකා බැලිය යුතු අදාල ආකෘති, විෂයයන් යනාදිය සකස් කර ඊට අනුකූලව ප්‍රසම්පාදන කාර්යයන් ඉටුකර නොතිබුණි.

## 4.4 අයවැය ලේඛන

2003 ජූනි 02 දින හා අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 5.2.1 වගන්තිය හා 1971 අංක 38 දරන මුදල් පනතේ 8(3) ඡේදය ප්‍රකාරව අයවැය ගත ආදායම් හා වියදම් ගිණුම, ශේෂ පත්‍රය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශය ඉදිරිපත් කර නොතිබුණි.

## 5. පද්ධති හා පාලනයන්

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින් වර ආයතනයේ අධ්‍යක්ෂ වෙත යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු විය යුතුය.

(i) අයවැය
(ii) වාහන භාවිතය හා පාලනය
(iii) මානව සම්පත් කළමනාකරණය
(iv) අත්තිකාරම් ලබාදීම හා පියවීම
(v) ණයගැතියන් හා ණයහිමියන්